**ශීර්ෂය - 149 කර්මාන්ත අමාත්‍යාංශය**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය -149 කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ඔක්තෝබර් 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් ඉදිරිපත් කර තිබුණු නිර්දේශයන්ගෙන් මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීමේ (ඇ)(v),(vi),(vii) ඡේදයන්හි දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් නොවන ලැබීම්**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (i) 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 3.1 ඡේදය අනුව CIGAS යොමුව මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු බව දක්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ CIGAS යෙදුම මගින් ලබාගත් ශේෂ පිරික්සුම අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.2,063,733,470ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එය රු.2,972,105,784 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.908,372,314කින් වැඩිවීම රාජ්‍ය අමාත්‍යාංශවල අග්‍රිම ලැබීම් ලෙස රු.908,372,314ක් සඳහන් කර තිබුණද එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වලද ඇතුලත්ව නොතිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ලෙස රු.2,972,105,784 ක් ලෙස දක්වා ඇත්තේ ACA 3 ආකෘති පත්‍රය පදනම් කරගෙනය. එම වටිනාකම සැකසී ඇත්තේ 2022 වසර සඳහා ඍජුව අමාත්‍යාංශය වෙත ලැබුණු අග්‍රිම සහ වර්ෂයේ මුල් මාස 09හි අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය අමාත්‍යාංශ වලට ඍජුව ලද අග්‍රිම පදනම් කරගෙනය.එසේම අදාල ශේෂ පිරික්සුමෙහි රාජ්‍ය අමාත්‍යාංශ වලට ලබා දුන් අග්‍රිම ශේෂයන් ද වෙන් වෙන් වශයෙන් පෙන්විය යුතු බවත්, මෙම අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුමෙහි එලෙස රාජ්‍ය අමාත්‍යාංශ වලට ලබා දුන් අග්‍රිම ශේෂයන් පෙන්නුම් නොකිරීම ගැටලුවක් බවත් වැඩි දුරටත් අනාවරණය විය. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම් වශයෙන් ගිණුම්ගත කරනුයේ භාණ්ඩාගාර අග්‍රිම හැර අත්තිකාරම් බී ගිණුමට මුදලින් කරන පියවීම්, තැන්පතු ලැබීම් හා වෙනත් ලැබීම් වශයෙන් වර්ෂයේ ලැබීම් වේ.ඒ අනුව එම ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු හා අත්තිකාරම් ගිණුම් වශයෙන් ආදායම් නොවන ලැබීම් ලෙස ඇතුලත්ව තිබියදීත් නැවතත් වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස රු.90,105,029ක් දැක්වීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම් රු.90,105,029ක් වැඩියෙන් දක්වා තිබුණි. | ACA3 ආකෘති පත්‍රය අනුව භාන්ඩාගාරයෙන් ලැබුණු අග්‍රිම වටිනාකම 2,972,105,784 ට අමතරව වෙනත් මූලාශ්‍ර වලින් ලද ලැබීම්ද ඇතුලත් කලයුතු වේ. ඒ අනුව අමාත්‍යාංශයේ හා ඒ යටතේ වූ රාජ්‍ය අමාත්‍යාංශ 03කට අදාල වෙනත් මූලාශ්‍ර ලැබීම් ඇතුලත් රු.90,105,029 ක මුදල ඇතුලත් කර ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | CIGAS යෙදුම මගින් ලබාගත් ශේෂ පිරික්සුම අනුව රාජ්‍ය අමාත්‍යාංශවල වියදම් අධිභාර ලෙස දක්වා තිබුණද රු.591,034,918 ක් වූ අධිභාර, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට ඇතුලත් කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණයෙහි සඳහන් රු.591,034,918 වටිනාකමට එළඹීම පිළිබද අවබෝධයක් නොමැත. එහෙත් සාමාන්‍ය ගිණුම්කරණ මූලධර්මයන් අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා පදනම් කරගත යුතු වන්නේ අදාල කාල පරාසය තුල ආයතනයට මුදලින් ලැබුණු ලැබීම් හා මුදලින් කරනු ලැබූ ගෙවීම් වටිනාකම්ය. එහෙත් ඔබ විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි මෙම අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය අමාත්‍යාංශවල වියදම් පවරා ගැනීම වෙනුවෙන් අධිභාර කරන ලද රු.591,034,918ක මුදලක් ද මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙසට ඇතුලත් කිරීම පිළිගත නොහැකි තත්වයකි. | ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි අධිභාර ලෙස ගලපා තිබූ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.613,145,309 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.30,824,479 ක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.582,320,830 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ නිරීක්ෂණයෙහි සඳහන් රු.613,145,309 වටිනාකමට එලඹීම පිළිබඳවද අවබෝධයක් නොමැත.එහෙත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් ගණනය කරන බැවින් ශේෂ පිරික්සුමෙහි 149 වැය ශීර්ෂය හැර අනෙකුත් සියලු වැය ශීර්ෂයන්හි පුනරාවර්තන වියදම් හි ගෙවීම් රු.594,639,603ක වටිනාකමින් ලැබීම් රු.563,815,124ක් අඩු කිරීමෙන් අනතුරුව එළඹි ශුද්ධ වටිනාකම වන රු.30,824,479ක අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් ලෙස කාණ්ඩ ගත කර ඇත.තවද ප්‍රාග්ධන වියදම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යන කාණ්ඩය යටතේ පිළිගත් ගිණුම්කරණ ක්‍රම වලට අනුව ගොනු කර ඇත. | වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් කරන ලද වියදම නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (iii) | භෞතික වත්කම් ඉදිකිරිම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම අනෙකුත් ශීර්ෂ ලෙස රු.8,714,088ක සෘණ අගයක් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් යටතේ මුදල් ප්‍රවාහය ප්‍රකාශයට ඇතුලත් කර තිබුණි. | 149 වැය ශීර්ෂය හැර අනෙකුත් සියලු වැය ශීර්ෂයන්හි පුනරාවර්තන වියදම් ශේෂයන්හි ශුද්ධ අගය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් ගණනය සඳහා යොදා ගත් අතර 149 වැය ශීර්ෂය හැර අනෙකුත් සියලු වැය ශීර්ෂයන් වල ප්‍රාග්ධන වියදම් හි ගෙවීම් 21,530,626ක ගෙන් ලැබීම් 30,244,713 ක් අඩු කිරීමෙන් අනතුරුව එළඹි ශුද්ධ වටිනාකම වන රු. 8,714,087 ක අගය සෘණ අගයක් වූ බැවින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ පෙන්නුම් කර ඇති අතර අගයක් වශයෙන් එය සෘණ ශේෂයක් පෙන්නුම් කල බැවින් 149 වැය ශීර්ෂයට අයත් මුදලින් දරණ ලද සියළු ප්‍රාග්ධන වියදම් වටිනාකමට පහලින් (භෞතික වත්කම් ඉදිකිරීම හෝ | භෞතික වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම සෘණ අගයක් ගැනීම පිළිගත නොහැකි තත්ත්වයක් වන අතර නිවැරදි වටිනාකම් ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්) වරහන් තුල පෙන්නුම් කර ඇත. | |

(ඇ) **අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | වාර්තාවේ 1.6.1(අ)(i) හා (ii) ඡේදයන්ට අනුව ආදායම් නොවන ලැබීම් රු.998,477,343 ක් වැඩියෙන්ද, 1.6.1 (ආ)(ii) ඡේදය අනුව වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.582,320,830ක් අඩුවෙන්ද දක්වා තිබීම හේතුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එකතු කිරීම්වල වටිනාකම රු.416,156,513ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඔබ විගණන නිරීක්ෂණයේ මෙම අයිතමයන් නිසා වෙනසක් හට ගන්නා බවට නිරීක්ෂණය කර තිබුණද ඉහත විගණන නිරීක්ෂණ වලට අදාලව ලබා දුන් පිළිතුරු වලට අනුව අදාල දත්ත පදනම්ව මූල්‍ය ප්‍රකාශය පිළියෙල කර ඇත.මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සැකසීමේදී මෙම අගයන් යොදාගෙන ඇති බැවින් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේදී අදාල සැසඳීම් කිරීමේදීද එම වටිනාකම් වෙනසට හේතු ගැලපීම සඳහා යොදා ගෙන ඇත.ඉහත නිරීක්ෂණ සඳහා පැහැදිලි කල ආකාරයට සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දත්ත පදනම් කර අග්‍රිම සැසඳීම් ප්‍රකාශය පිළියෙල කර එහි එකතු වටිනාකම රු.1,123,954,657ක වටිනාකමට එළඹී ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ii) | වාර්තාවේ 1.6.1(ආ)(i) ඡේදය අනුව රු.591,034,918 ක් වූ රාජ්‍ය අමාත්‍යාංශවල වියදම් අධිභාර ලෙස ගණනය කර අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබීම හේතුවෙන් හා 1.6.1(ආ)(iii) ඡේදය අනුව භෞතික වත්කම් ඉදිකිරිම් හෝ මිලදී ගැනිම් හා ආයෝජන අත්කර ගැනීම් රු.8,714,088 ක් අනෙකුත් ශීර්ෂ වියදම ලෙස හා බතික් රාජ්‍ය අමාත්‍යාංශයේ වියදම් මගින් පියවන ලද අතුරු අග්‍රිම ය ලෙස රු.125,000 ක් අග්‍රිම | ඉහත නිරීක්ෂණ වලට අදාල පිළිතුරු වලින් පෙන්වා දී ඇති පරිදි ඔබ විගණන නිරීක්ෂණ සඳහා පදනම් කරගත් වටිනාකම සහ අප අග්‍රිම සැසඳුම් ප්‍රකාශය සඳහා යොදාගත් වටිනාකම් අගයන් වෙනස්වන බැවින් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩු කිරීම් අගය වෙනස් විය යුතුය. ඒ අනුව අපගේ අඩු කිරීම් අගයන්හි එකතු වටිනාකම රු.1,410,219,308 ක් ලෙස නිවැරදි අගයක් නිරූපනය කරයි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

සැසඳුම් ප්‍රකාශයේ අඩුකිරීම් යටතේ වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩු කිරීම්වල වටිනාකම රු.582,195,830ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA6 ආකෘතියේ) අනුව ප්‍රවාහන උපකරණ සහ අනෙකුත් යන්ත්‍ර හා උපකරණවල වටිනාකම පිළිවෙලින් රු.483,123,759 ක් හා රු.94,651,338 ක් වූ අතර 2022 ජනවාරි 01 දිනට ඒවායේ ආරම්භක ශේෂ වටිනාකම පිළිවෙලින් රු.820,215,340 ක් හා රු.244,512,882 ක් වූයෙන් රු.486,953,125 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන උපකරණ හා අනෙකුත් යන්ත්‍ර හා උපකරණ වල ශේෂ පිළිවෙලින් රු. 483,123,759 හා රු. 94,651,338 ලෙස දක්වා ඇත්තේ ශීර්ෂ අංක 149 යටතේ කැබිනට් අමාත්‍යාංශය තනිව ක්‍රියාත්මක වනවිට පැවති ශේෂයන් වන අතර රාජ්‍ය අමාත්‍යාංශ මෙම අමාත්‍යාංශයට ඒකාබද්ධ වීමට අදාල මූල්‍ය නොවන වත්කම් 2022 ඔක්තෝබර් 01 දිනට පැවරීමට අදාල සටහන 2022 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස වාර්තාගත වී තිබීම නිසා මෙම වෙනස ඇති වී තිබේ. මෙහි ඇති වී ඇති දෝෂ පිළිබඳව ඉදිරියේදී භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර අදාල නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | ආරම්භක ශේෂ වල වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ii) | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ACA6 අකෘතියේ ඇතුලත් අපහරන ලෙස දක්වා ඇති රු.80,430,000 ක් වූ ප්‍රවාහන උපකරණ හා රු. 1,648,500ක් වූ අනෙකුත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම හා ආරම්භක | **ප්‍රවාහන උපකරන අපහරණ - රු.80,430,000**<br><br>මෙම අමාත්‍යාංශය යටතේ පැවති බතික් අත්යන්ත්‍ර රෙදිපිළි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 439 හි පැවති ප්‍රවාහන උපකරණ යටතේ වූ රථ වාහන 12ක් අදාල රාජ්‍ය | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට හා අනාවරණයන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ශේෂයට එකතු කිරීම් ලෙස දක්වා ඇති රු.407,702 ක් වූ අනෙකුත් යන්ත්‍ර හා උපකරණ වටිනාකම සහ මාරුකිරීම් ලෙස දක්වා ඇති රු.1,084,688ක් වූ අනෙකුත් යන්ත්‍ර හා උපකරණ සම්බන්ධ වටිනාකම් ගිණුම්කරණ දෝෂයන් වන නමුත් ඒවා මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට හෝ අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ අහෝසි කර ඒවායේ වූ මූල්‍ය නොවන වත්කම් මෙම අමාත්‍යාංශය වෙත පැවරීමට කටයුතු කරන ලදී. එලෙස කටයුතු කිරීමේදී අදාල රාජ්‍ය අමාත්‍යාංශ වත්කම් පැවරීමට ජර්නල් සටහන් CIGAS පරිගණක පද්ධතිය තුල සටහන් කිරීමේදී එය වත්කම් අපහරන යටතේ වාර්තා කර ඇතත් වත්කම් ඉවත් කිරීමක් නොවන බව පෙන්වා දෙමි.මෙහි ඇති වී ඇති දෝෂ පිළිබඳව ඉදිරියේදී භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර අදාළ නිවැරදි කිරීම් සිදු කරන බවද දන්වමි.<br>**අනෙකුත් යන්ත්‍ර හා උපකරණ - අපහරන රු. 1,648,500**<br>පරිගණක වැඩසටහන තුල අත් වැරදීමකින් ඇතුලත් කර ඇති සටහනක් වන අතර එය ඉදිරියේදී අදාල පරිදි ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>**ආරම්භක ශේෂයට එකතු කිරීම් රු.407,702**<br>මෙම මුදල රු.407,702 ලෙස දක්වා තිබුණද එම වටිනාකම එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශ 3ට අදාලව රු.495,706 පමණ වේ . | |
| (iii) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ACA 6 ආකෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මගී වාහන වටිනාකම රු.703,322,021 ක් වුවද, වාහන සම්බන්ධ ලේඛනයේ එම වටිනාකම රු.743,887,021 වුයෙන් වෙනස රු.40,565,000 ක් විය. | මෙම අමාත්‍යාංශය සතු වාහන සංචිතයට එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශ වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන ගිය මූල්‍ය නොවන වත්කම් අදාල CIGAS පරිගනක වැඩසටහන මගින් මෙම අමාත්‍යාංශය වෙත පැවරීම් කිරීමට අදාල සටහන් යෙදීමේදී කිසියම් වෙනස්කම් සිදු වී ඇති බවට නිරීක්ෂණය වන අතර මෙම | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් මූල්‍ය නොවන වත්කම් ශේෂ අදාල ලේඛන සමග සැසඳීම් කර ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මූල්‍ය නොවන වත්කම් ශේෂ අවශ්‍ය ගිණුම් ගලපා සැසඳීම් කිරීමට කඩිනමින් කටයුතු කරන බව දන්වමි. | |
| (iv) | 2022 දෙසැම්බර් 31 දින වන විට අපහරණය කර තිබුණු රු.3,025,000ක් වන වාහන 02 ක වටිනාකම ඉදිරිපත් කළ වාහන ලේඛනයේ ඇතුලත්ව තිබුණි. | ඔබ විසින් නිරීක්ෂණයේ පෙන්වා දී ඇති පරිදි වැරදීමකින් අදාල අපහරනය කරන ලද වාහන තව දුරටත් මූල්‍ය නොවන වත්කම් යටතේ නිරූපනය කරයි. මෙම වටිනාකම කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ලේඛන නිවැරදිව යාවත්කාලින කර පවත්වා ගත යුතුය. |
| (v) | මුදල් අමාත්‍යාංශය හා දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත පවරා තිබුණු රු.13,200,000ක් වටිනා වාහන 02 ක් කර්මාන්ත අමාත්‍යාංශයේ වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | එක් වාහනයක් දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත පැවරීම සනාථ කරන ලද ලිපිය ඇත. ඒ අනුව ගිණුම් වලින් ඉවත් කල හැක. අනෙක් වාහනයේ ලියාපදිංචි සහතිකය වෙළඳ අමාත්‍යාංශයට භාර දෙන ලදී. වාහනය එම අමාත්‍යාංශයෙන් රැගෙන යාමට පෙර, වාහනය මුදල් අමාත්‍යාංශයට ලබා දෙන ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් කරන ලද දැනුම් දීම අනුව වාහනය මුදල් අමාත්‍යාංශයට භාර දෙන ලදී. ලියාපදිංචි සහතිකය වෙළඳ අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලෙස දැනුම් දෙන ලදී. එම වාහනය පවරා ගැනීම සම්බන්ධව මෙතෙක් තොරතුරක් ලැබී නැත. පවරා ගැනීම සම්බන්ධ තොරතුරු මුදල් අමාත්‍යාංශයෙන් තහවුරු කර ගැනීමෙන් පසු ගිණුම්වලින් ඉවත් කල හැක. | අමාත්‍යාංශය සතු නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කළ යුතුය. |
| (vi) | විවිධ අමාත්‍යාංශවලින් රු.4,800,000 ක වටිනාකමැති වාහන 03 ක් කර්මාන්ත අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එම වාහන ලියාපදිංචි අමාත්‍යාංශ අහෝසි කර තිබුණි. එම වාහන | එක් වාහනයක් සතොස ආයතනයට වෙනත් අමාත්‍යාංශයකින් ලබා දී තිබුණු අතර වසර කීපයක් ධාවන තත්වයේ නොතිබූ බැවින් අපහරනය සඳහා මෙම අමාත්‍යාංශයට රැගෙන එන ලදී. මෙහි ලියාපදිංචි සහතිකය නැත. | කඩිනමින් පවරා ගැනීමට කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යාංශය විසින් භාවිතා කලද එහි වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | පසුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය කල ඉල්ලීමක් අනුව තවත් වාහන කීපයක් සමග මෙම වාහනය ලබා දුන් අතර පවරා දීම සඳහා පැවරුම් පත්‍ර ඉදිරිපත් කරන ලෙස දැන්වූවද මෙතෙක් එම ලේඛන ඉදිරිපත් කර නැත. මෙම කරුණු හේතුවෙන් උක්ත වාහනය ගිණුම් ගත කර නැත.<br><br>අනෙක් වාහන 02ක මෙම අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති පරන්තන් කෙමිකල්ස් ආයතනයේ රාජකාරි සඳහා තාවකාලික පදනම මත ලබා දී ඇත. අමාත්‍යාංශයේ නමින් ලියාපදිංචිය නොමැති වීම හේතුවෙන් ගිණුම් ගත කර නොමැති අතර එම වාහන අමාත්‍යාංශයට පවරා ගැනීමෙන් අනතුරුව ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (vii) | අමාත්‍යාංශය විසින් වියදම් දරා ඉදිකරන ලද ගොඩනැගිලි වටිනාකම එහි මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කල යුතු වුවත් කර්මාන්ත සංවර්ධන අංශයෙන් ලද තොරතුරුවලට අනුව 1996 වර්ෂයේ සිට කර්මාන්තපුර 16 ක ඉදිකල පරිපාලන ගොඩනැගිලි 13 ක, කර්මාන්තශාලා 03 ක හා කාර්යාල නිවාස/සේවා ගොඩනැගිලි 02 ක වටිනාකම වූ රු.මිලියන 456.98 ක් 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර නොතිබුණි. | මෙම සියළුම පරිපාලන ගොඩනැගිලි, අදාල පළාත්වල ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ භාවිතයට ගනු ලැබේ. මෙම වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ ද සාකච්ඡා කළ අතර ඒ් ලැබුණු උපදෙස් පරිදි අදාල නිලධාරීන් විසින් එක් එක් වත්කම් කාණ්ඩ යටතේ වෙන් වශයෙන් හඳුනාගෙන ඇති අතර 2023 වසර තුල දී එම වත්කම් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ලෙසට ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. | ප්‍රාග්ධනිත වියදම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

(ඉ) රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.198,397 ක් වූ ණය ශේෂයද , වැඩ තහනමට ලක් වූ එක් නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.100,208 ක් වූ ණය ශේෂයද, සේවය හැර ගිය නිලධාරින් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.273,029 ක් වූ ණය ශේෂයන්ද වශයෙන් එකතුව රු.571,634ක් වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට අය නොවී පැවතුණි. | මියගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ මරණ පාරිතොෂිකයෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. වැඩ තහනමට ලක් වූ එක් නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.100,208ක මුදල අයකරගැනීම සඳහා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර සේවය හැර ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් වාරික වශයෙන් ණය අයකිරීම ආරම්භ කර ඇත. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඊ) තැන්පත් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතු තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණුමේ ශේෂය රු.20,279,073 විය. | වසර 10 ක වැඩි කාලයක සිට පවතින තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතුවකි.එම තැන්පතු මුදල් ලබාගනුයේ කර්මාන්තකරුවන් සඳහා ඉඩම් කට්ටි වෙන්කිරීමට වන අතර එම කර්මාන්තපුරවල සිදුකරන ව්‍යාපෘති කටයුතු සඳහා එම ඉඩම් රජයට පවරා ගැනීම හා ආයෝජකයන් වෙත වෙන්කර දීම ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම, ප්‍රාදේශිය ලේකම් යන රාජ්‍ය ආයතනවල සාමුහිකත්වයෙන් සිදුවන කටයුත්තක් බැවින් ඒ | තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සඳහා තරමක කාලයක් ගතවෙයි. කෙසේ වෙතත් ඉදිරියේදී අමාත්‍යාංශ ලේකම් හා අනිකුත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සෘජු මැදිහත්වීම මත අදාල කටයුතු කඩිනම් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. ඒ අනුව ඉදිරියේදී මෙම තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළහැකි වනු ඇත. | |
| (ii) 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතු කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ගිණුමේ ශේෂය රු.38,291,283 ක් විය. | පසුගිය කාලය තුළ රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය තුල ඉන්ධන මිළ ඉහළයාම ඉදිකිරීම් ද්‍රව්‍යවල හිඟකම හා රජයේ හිඟ බිල්පත් ගෙවීම පමාවීම යනාදිය හේතුවෙන් කොන්ත්‍රාත් කටයුතු නිසි පරිදි ඉටුකිරීමට නොහැකිවීමෙන් රඳවා ගන්නා ලද තැන්පතු නිදහස් කිරීමේ කටයුතු ඇණහිටීමක් සිදුවී ඇත. | අදාල කාර්යයන් නිම වූ පසු රඳවා ගන්නා ලද තැන්පතු නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයයන් 66 කට අදාළව සලසන ලද රු.471,095,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.115,891,080 උපයෝජනය කර රු.355,203,920 ක ඉතිරියක් පැවතුණ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | කර්මාන්ත අමාත්‍යවරයා කර්මාන්ත හා වැවිලි කර්මාන්ත යන අමාත්‍යාංශ දෙකෙහිම ඇමති ධුරය දරන බැවින් අමාත්‍යාංශ 2 අතර ඇමතිතුමාගේ හා කාර්ය මණ්ඩලයේ වියදම් බෙදී යාමක් සිදුවේ.වැය විෂයයන් 6ක ඉතිරිවීම් සඳහා එය හේතු විය.<br><br>ඊට අමතරව අනෙකුත් වැය විෂයයන්ගේ ඉතිරිවීම් සඳහා රජයේ වියදම් කළමනාකරණය යටතේ අත්‍යාවශ්‍ය නොවන සියලු වියදම් සීමා කිරීම, රටේ පැවති උග්‍ර ආර්ථික අර්බුදය හමුවේ සැපයුම් සීමා වීම නිසා වාහන නඩත්තු කටයුතු කල් දැමීමට සිදු | නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වීම, රටේ පැවති ආර්ථික අර්බුදය මත මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම ආදි කරුණු හේතු විය. | |
| (ආ) | වැය විෂයය 18 කට අදාළව සලසන ලද රු.100,650,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වියදම් කිරීමකින් තොරව ඉතිරි වී තිබුණි. | රාජ්‍ය වියදම් චක්‍රලේඛ මත පදනම්ව වියදම් පාලනය කිරීම මත අත්‍යාවශ්‍ය නොවන නඩත්තු වියදම් සීමා වීම, අපේක්ෂිත පරිදි වියදම් දැරීමට සිදු නොවීම,රජයේ ප්‍රතිපත්ති ප්‍රකාරව වියදම් සීමා කිරීමේ අරමුණෙන් නව මිලදී ගැනීම් අවම කිරීම ආදි කරුණු මෙම වැය විෂයයන්හි මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වීමට හේතු වූ බව දක්වා ඇත. | නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි ගෙවීම් වවුචර පරීක්ෂාවේදි වැය විෂයයන් 14 කට අදාලව රු.2,726,134 ක් වූ ගෙවීම් 2022 වර්ෂයට අදාළව සිදුකර තිබුණු බව නිරීක්ෂණය වූ අතර එම වටිනාකම බැරකම් පිළිබද ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට ගෙවීමට නියමිතව තිබූ අක්මුදල් නොමැති බැවින් ගෙවීම් කිරීමට නොහැකි වූ වවුචර්පත් වටිනාකම බැරකම් ලෙස 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉදිරිපත් කර ඇත.2023 වර්ෂය ආරම්භ වීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වරින් වර 2022 වර්ෂයට අදාළව 2023 වර්ෂයේ ගෙවීම් කිරීම සදහා ඉදිරිපත් වන වවුචර්පත් බැරකම් ලෙස සටහන් කර නොමැත. එමෙන්ම, මෙම බොහෝ වවුචර්පත් 2022 වසරේ අවසාන මාසයට අදාල අතිකාල, ගමන් වියදම්, ජල, හෝ විදුලි බිල්පත් වන අතර සාමාන්‍යයෙන් එම බිල්පත් ගෙවීම් කිරීමට ඉදිරිපත් වන්නේ ඊට පසු මාසයේදීය. | බැරකම් පිළිබද ප්‍රකාශයේ වර්ෂයට අදාල සියලු බැරකම් දැක්විය යුතුයි. |

පෙර වසරේ බැරකම් ලෙස සටහන් කලද, මෙම වසර ආරම්භයෙන් පසු ගෙවීම් කිරීමට යොදා ගැනෙන්නේද ප්‍රවර්තන වර්ෂයේ අක් මුදල් හා ප්‍රතිපාදන වේ.

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 570 (ආ), (ඇ) | රු.29,941,927 ක් වටිනා තැන්පතු 53 ක් වසර 02 කට වැඩි කාලයක සිට පවතී. | පසුගිය කාලය තුළ රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය තුළ ඉන්ධන මිල ඉහළයාම, ඉදිකිරීම් ද්‍රව්‍යවල හිඟකම හා රජයේ හිඟ බිල්පත් ගෙවීම පමාවීම යනාදිය හේතුවෙන් කොන්ත්‍රාත් කටයුතු නිසි පරිදි ඉටුකිරීමට නොහැකිවීමෙන් රඳවා ගන්නා ලද තැන්පතු නිදහස් කිරීමේ කටයුතු ඇණහිටීමක් සිදුවී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | රජය සතු සෑම වාහනයක් සඳහාම වර්ෂ 5කට වරක් තක්සේරුවක් ලබා ගැනීම අනිවාර්ය වන අතර එම තක්සේරු වටිනාකම ගිණුම්කරණ කටයුතු සඳහා පමණක් යොදා ගත | වාහන තක්සේරු කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| මූලා නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ 1.3.1 වගන්තිය | යුතු බව සඳහන් වුවද අමාත්‍යාංශය සතු රුපියල් මිලියන 438.42 ක වටිනාකමකින් යුත් වාහන 65ක් සම්බන්ධයෙන් එලෙස තක්සේරු කටයුතු සිදු කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රයිගම හරිත කාර්මික හා තාක්ෂණික සංවර්ධන සුපිරි කර්මාන්ත කලාපයක් ස්ථාපිත කිරීම සඳහා එහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. මිලියන 97.27 ක මුදලක් 2022 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවෙන් වෙන් කර තිබුණු අතර ඒ සඳහා රු.48,182,982 ක වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි ඉදිකිරීම් කටයුතු නිම කළ යුතු වුවද මූල්‍ය ප්‍රගතිය සියයට 49 ක් විය. ඉහත වියදමින් ජලසැපයුම සඳහා රු.29,570,000 ක් වැය කර තිබුණ ද භෞතික ප්‍රගතිය සියයට 20 ක් පමණක් විය. | 2022 වර්ෂයේ වෙන්කල මුළු ප්‍රතිපාදන භාවිතා නොවීමට හා අපේක්ෂිත භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි වූයේ පහත හේතූන් නිසාවෙනි.<br><br>1. එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ විරෝධතාවය හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමේ ගැටළුකාරී තත්වයන් පැන නැගීමෙන් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වීම.<br><br>2. ඒ හේතුවෙන් පසුව අමුද්‍රව්‍ය ඇතුළු ඉදිකිරීම් පිරිවැය සීඝ්‍රලෙස ඉහළ යාම නිසා ව්‍යාපෘතියේ කටයුතු සඳහා පිරිවැය සංශෝධනය කිරීමට ඉදිකිරීම් කොන්ත්‍රාත් ආයතනය පියවර ගත් අතර එම නව ඇස්තමේන්තුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවද ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ විරෝධතා ගැටළුව විසදෙන තුරු ඉදිරි කටයුතු නතර කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් උපදෙස් ලබාදීම. | කර්මාන්තපුර සංවර්ධන කටයුතු කඩිනමින් නිමකර කර්මාන්ත ආරම්භ කිරීමට කර්මාන්තකරුවන් යොමු කිරීම කළ යුතුය. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 වන විට කර්මාන්තපුර 15 කට අදාලව ඉඩම් කට්ටි 66 ක් කර්මාන්තකරුවන් වෙත වෙන් කර ලබා නොදීම හේතුවෙන් එම ඉඩම් නිශ්කාර්යව පැවතුණි. | මීට අදාළ හේතු පහත පරිදි වේ.<br>නිමි නිෂ්පාදනයන් අලෙවිකිරීමට කොළඹ රැගෙන ආ යුතු බැවින් ගමනාගමන කටයුතු සඳහා ඉහල වියදමක් දැරීමට සිදුවීම හා කර්මාන්තපුර භූමිය සමතලා බිමක් ලෙසට සංවර්ධනය කර නොමැතිවීම හේතුවෙන් වර්ෂා කාලයන්හිදී වැසි ජලයෙන් පිරීයාම හේතුවෙන් මන්නාරම කර්මාන්තපුරයේ ඉඩම් කට්ටි 17ක්ද මුලතිවු දිස්ත්‍රික්කයේ හුදකලාවූ ස්ථානයක කර්මාන්තපුරය පිහිටීම හේතුවෙන් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ඉඩම් ඉල්ලුම් කිරීම ඉතා අඩුවීමත්, නිසි පානීය ජල සැපයුම් පද්ධතියක් කර්මාන්තපුරය පිහිටි ප්‍රදේශයට නොතිබීම හේතුවෙන් කර්මාන්තකරුවන් ආයෝජනය සඳහා ඉදිරිපත් නොවීමත් හේතුවෙන් වැලිඔය කර්මාන්තපුරයේ ඉඩම් කට්ටි 05ක්ද විධිමත් ප්‍රවේශ පහසුකම් නොමැති වීම හේතුවෙන් ආයෝජකයන් වෙත ඉඩම් ලබා දීමට අපහසුව වීම, අක්‍රිය වීම හේතුවෙන් කර්මාන්ත අවලංගු කිරීමට සිදුවීම,අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද නමුත් කර්මාන්තය ආරම්භ කිරීමට පියවර නොගැනීම හේතුවෙන් කර්මාන්ත අවලංගු කිරීමට සිදුවීම වැනි කරුණු හේතුවෙන් කර්මාන්තපුර 13 ක හිස් ඉඩම් පවතින බව. | සුදුසු ආයෝජකයින් තෝරා ඉඩම් ලබාදී කර්මාන්ත ආරම්භ කරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බුත්තල කර්මාන්තපුරයේ ඉඩම් කට්ටි 43 ක් වෙන් කර තිබුණු අතර, 2016 වර්ෂයේ සිට 2021 දක්වා කර්මාන්තකරුවන් 15 දෙනෙකු වෙත හා 2022 වර්ෂයේදී තවත් කර්මාන්තකරුවන් දෙදෙනෙකු වෙත ඉඩම් කට්ටි 41 ක් ලබා දී තිබුණි. ඉන් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන්නේ කර්මාන්තකරුවන් 5 ක් වන අතර කර්මාන්තකරුවන් 7 ක් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවති. කර්මාන්තකරුවන් තිදෙනෙකු වෙත වෙන් කර දී තිබුණ පර්චස් 340.8ක් වූ මුලු ඉඩම් ප්‍රමාණයම කිසිදු ඉදිකිරීම් කටයුත්තක් ආරම්භ කර නොතිබීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. | නිරීක්ෂිත දිනය වන විට නිෂ්පාදන කටයුතු සිදු කරන කර්මාන්ත ආයතන 04 ක් පැවති නමුත් මේ වන විට නිෂ්පාදන කටයුතු සිදු කරන ආයතන 05 ක් පවතින බවද, නිරීක්ෂිත දිනය වන විට ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පැවති ආයතන සංඛ්‍යාව 04 ක්ව පැවති නමුත් 2023 මැයි මාසය වනවිට එම ආයතන සංඛ්‍යාව 07 ක් බවද, කිසිදු සංවර්ධන කටයුත්තක් ආරම්භ කර නොතිබුණු කර්මාන්තකරුවන් සම්බන්ධයෙන් ඉදිරියේදි පැවැත්වීමට නියමිත ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබා ගනිමින් ඒ අනුව ව්‍යාපෘතිය පිළිබඳ අවසන් තීරණයක් ගැනීමට කටයුතු කරන බව. | කර්මාන්තකරුවන් විසින් කර්මාන්ත ඉදිකිරීම් කටයුතු හා වැඩ ආරම්භ කිරීම සම්බන්ධයෙන් ලබාදෙන වැඩ සැලැස්ම අනුව කටයුතු කරන්නේද පිළිබඳව අමාත්‍යාංශය නිරතුරුව අවධානය යොමු කළ යුතුය. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 ඔක්තෝබර් 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මතුගම කර්මාන්තපුරයෙන් සෘජු රැකියා 1500 ක් පමණ ජනනය කිරීමට අපේක්ෂා කර තිබුණද, කර්මාන්ත 16 කින් රැකියා 388 පමණක් උත්පාදනය කර තිබුණි. | 2019 වසරේ සිදු වූ පාස්කු ප්‍රහාරයට පසු 2020 වර්ෂයේ ඇති වූ කොරෝනා වසංගත තත්වය, වසර 03 ක පමණ කාලයක සිට රටෙහි ඇති වූ ආර්ථික අර්බුදය, රජය විසින් ඉන්ධන සීමා කිරීම, භාණ්ඩ විශාල ප්‍රමාණයක් මෙරටට ගෙන්වීම සීමා කිරීම, ඇමෙරිකානු ඩොලරයේ අගය ඉහළ යාම, විදුලි කප්පාදුව හා විදුලි බිල ඉහල නැංවීම වැනි හේතුන් මත කර්මාන්තශාලාවල නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකිවීම හේතුවෙන් | කර්මාන්තකරුවන් විසින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේදී බිහිකිරිමට අපේක්ෂා කළ රැකියා ප්‍රමාණය කරා ලඟාවීමට කර්මාන්තකරුවන් යොමුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශය අපේක්ෂා කළ මට්ටමින් රැකියා අවස්ථාවන් ජනනය කිරීමට මතුගම කර්මාන්තපුරයේ කර්මාන්තකරුවන්ට නොහැකි වී ඇති බව. | |
| (ආ) | බටඅත කර්මාන්තපුරය හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 105 ක ඉඩම් ප්‍රමාණයක් රු.මිලියන 330.93 ක වියදමක් දරා සම් පදම් කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා කර්මාන්තපුරයක් ලෙස සංවර්ධනය කරමින් 1999 වර්ෂයේදී ඉදිකර තිබුණි. එහෙත් මෙම කර්මාන්තපුරයෙන් බැහැර කරන අපද්‍රව්‍ය මුහුදට යොමු කිරීමට යෝජනා වී තිබීම හේතුවෙන් කර්මාන්තපුරය අවට ධීවර ජනතාවගේ විරෝධතා නිසා කර්මාන්තපුරයේ ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. ඉහත ඉඩම් අක්කර 105 සම්බන්ධයෙන් නැවතත් 2006 පෙබරවාරි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කර්මාන්තකරුවන් 15 ක් සඳහා අක්කර 45.625 ක් හා පොදු කටයුතු සඳහා අක්කර 8.72 ක් වෙන් කර තිබුණු අතර අක්කර 25 ක් කර්මාන්තකරුවන් 9 කට ලබා දීමට යෝජනා කර තිබුණි. එම හේතුවෙන් අක්කර 25.655 ක් වන ඉඩම් ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවතුණි. | අක්කර 105 කින් යුතු බටඅත කර්මාන්තපුරය 1999 වර්ෂයේදී සම් පදම් කිරීමේ කර්මාන්ත ස්ථානගත කිරීමේ අරමුණින් ඉදිකිරීම් ආරම්භ කළ අතර 2005 වර්ෂය අවසාන වන විට යටිතල පහසුකම් ඉදිකිරීම් කටයුතුවලින් සියයට 80ක් පමණ සම්පූර්ණ කර තිබුණි. ඒ වන විට කර්මාන්තපුරයේ අපජලය මුහුදට බැහැර කිරීමේ නල පද්ධතියේ ඉදිකිරීම් සිදුකරමින් පැවති අතර එම කාර්යය සඳහා කර්මාන්තපුරය අවට ධීවර ජනතාවගේ විරෝධතාවය මෙන්ම ප්‍රාදේශීය දේශපාලනික බලපෑම් ද හේතුවෙන් එම ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට සිදුවිය.<br>ප්‍රාදේශීය අධ්‍යක්ෂ (දකුණු පළාත) විසින් දන්වා ඇති පරිදි වර්තමානයේ දී බටඅත කර්මාන්තපුරයේ කර්මාන්තකරුවන් 15 කට ඉඩම් අක්කර 45.625 ක් වෙන් කර ඇති බවද, ඉඩම් අක්කර 25 ක් කර්මාන්ත සඳහා වෙන් කිරීමට යෝජිත බවද,පොදු කටයුතු සඳහා වෙන්කල බිම් ප්‍රමාණය අක්කර 8.72 ක් බවද, ඉතිරි බිම් ප්‍රමාණය අක්කර 24.65 ක් බව. | කර්මාන්ත සඳහා වෙන් කිරීමට යෝජිත හා නිෂ්කාර්යව පවතින ඉඩම් ප්‍රමාණය සුදුසු ආයෝජකයන් තෝරා ඉක්මනින් ලබාදී අදාළ භූමියෙන් ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය සතු ධාවන තත්ත්වයේ නොමැති වාහන 02ක් සහ රුපියල් මිලියන 4.5ක පිරිවැය වූ එක් වාහනයක් 2022 නොවැම්බර් 04 දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට ලබා දී තිබුණ ද එම වාහන වලට අදාලව නිසි පරිදි අයිතිය පැවරීමේ කටයුතු සිදු කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් වාහන පවරන ලෙස ඉල්ලමින් පැවරුම් පත්‍ර අදාළ කොටස් සම්පූර්ණ කර මෙම අමාත්‍යාංශයට එවීමෙන් අනතුරුව එම ලේඛන අත්සන් කර භාර දීම සිදු කරනු ලැබේ.<br><br>අනෙක් වාහනය ලිපියක් මගින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරා ඇති අතර මාරු කිරීමට අදාල ලියවිලි සකස් කරමින් පවතී. මෙම වාහනය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත බාර දී ඇති බැවින් මේ පිළිබඳව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙතින් විමසීම සුදුසුය. | කඩිනමින් අළුත්වැඩියාවට යොමුකළ යුතු අතර අපහරණය කළ යුතු මට්ටමේ වාහන ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වසර 1ත් 4 ත් කාල පරාසයක සිට අලුත්වැඩියාවන් සඳහා පෞද්ගලික ගරාජ වලට යොමු කර තිබු වාහන 03 ක් අලුත්වැඩියාවන් සිදුකර ධාවනයට එක්කර නොතිබුණි. මෙසේ රඳවා තබා තිබූ එක් වාහනයක් සම්බන්ධයෙන් රු.621,900ක අතිරේක මුදලක් සඳහා වගකීමට බැඳීමට අමාත්‍යාංශයට සිදු වී තිබුණි. | මෙම වාහනයේ හානිය අලුත්වැඩියාව සඳහා රක්ෂණ වන්දි අනුමත වී නොමැත.එබැවින් මේ සඳහා වගකිව යුතු පාර්ශවය වන ලංකා සිමෙන්ති සමාගමේ හිටපු සභාපතිගෙන් හානි පූර්ණය කර ගැනීම සඳහා කොල්ලුපිටිය පොලීසිය මගින් නඩු පවරා තිබුණද පොලීසිය විසින් මෙම අමාත්‍යාංශයෙන් තොරතුරු ලබා නොගෙන විදුලිබල අමාත්‍යාංශයෙන් තොරතුරු ලබාගෙන නඩුව අවසන් කර තිබුණි. එබැවින් නැවත නඩුව ආරම්භ කරන ලෙස පොලීසියට දන්වා ඇත. විශාල හානියක් බැවින් අලාභය අයකර ගන්නා තෙක් අධික මුදලක් ගෙවා | කඩිනමින් අළුත්වැඩියා කටයුතු අවසන් කර ධාවනයට එක්කර ගැනීමටත් හානි සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශය මගින් අලුත්වැඩියා කිරීම පිළිබඳ තීරණයක් ගැනීම සඳහා ඉංජිනේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර ඇත.<br><br>2021 වර්ෂයේ ඌව ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරයෙකු නොසිටි බැවින් හා වාහනය ධාවන තත්වයේ තිබූ බැවින් හා ප්‍රමුඛත්වය ලබා දිය යුතු අලුත්වැඩියාවන් සහිත වාහන තිබූ බැවින් මෙම අලුත්වැඩියාවට ප්‍රමුඛතාව අඩු විය.<br>අලුත්වැඩියා කල හැකි තත්වයේ ඇති වාහනය පවරාගෙන රු.4,500,000.00ක් ගෙවීමට රක්ෂණ සමාගම එකඟතාව එල කර ඇත්තේ හදිසි අනතුර සිදුවී වසරකට වැඩි කාලයක් ගතවීමෙන් අනතුරුව වේ<br>මේ සම්බන්ධව වැඩි දුර විමර්ශණය සඳහා අතිරේක ලේකම් (පාලන)ගේ සභාපතීත්වයෙන් යුතුව කමිටුවක් පත් කර ඇත. | |
| (ඇ) | අමාත්‍යවරයාගේ සම්බන්ධිකරණ ලේකම්වරයා විසින් භාවිතා කරන ලද වාහනයක් 2022 මැයි 09 දින අනතුරකට ලක් වී තිබුණු අතර අලුත්වැඩියා කිරීම සඳහා එහි නියෝජිත ආයතනය විසින් රු.7,507,726 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ නමුත් රක්ෂණ ආයතනය විසින් රු. 2,600,000ක මුදලක් පමණක් වන්දි ලෙස අනුමත කර තිබුණි. 2022 ජූලි මස 21 දින සිට, කිසිදු අලුත්වැඩියා කිරීමකින් තොරව මෙම රථය නියෝජිත ආයතනයේ රඳවා තිබුණි. | එවකට සිටි අමාත්‍යවරයාගේ සේවා කාලය අවසන් වූ පසු එම වාහන අමාත්‍යාංශය වෙත බාර දෙන ලෙස ලිඛිතව දන්වන ලදී. මෙම වාහනය අමාත්‍යාංශයට බාරදීමට පෙර හදිසි අනතුරට ලක්වී තිබේ.<br>රක්ෂණ වන්දි මුදල හා ඇස්තමේන්තු මුදල අතර විශාල වෙනසක් ඇති බැවින් වැඩි මුදල අය කර ගන්නා වගකිව යුතු පාර්ශවය පිළිබඳ කමිටු වාර්තාව ලැබෙන තෙක් අලුත්වැඩියාව ප්‍රමාද වී ඇත.මෙම වාහනයේ අලාභ හානිය සම්බන්ධව මු.රෙ.104 පරීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර පරීක්ෂණය සිදු කරමින් පවතියි. | කඩිනමින් අළුත්වැඩියාවන් සිදු කර ධාවනයට එක් කළ යුතු අතර අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකල යුතුය. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශිය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යවරයාගේ ආරක්ෂක නිල රථය ලෙස භාවිතා කර තිබුණු වාහනය 2021 ජනවාරි 13 දින සිදු වූ හදිසි රිය අනතුරකින් හානියට පත් වී තිබුණු අතර එම අවස්ථාවේ රියදුරු විසින් අනතුර පිළිබඳ රක්ෂණ ආයතනය හා පොලිසිය වෙත දැනුම් දී නොතිබුණි. රක්ෂණ වන්දි ගෙවීම රක්ෂණ ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව රු.1,323,900 ක් වූ වාහන අළුත්වැඩියා වියදමින් රක්ෂණ වන්දිය වශයෙන් ලද රු.200,000 අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල වන රු.1,123,900 ක් අමාත්‍යාංශයෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව මෙම වාහන අනතුර සම්බන්ධයෙන් සිදු වූ රු.1,123,900ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරයාගේ ආරක්ෂක නිල රථය ලෙස භාවිතා කළ මෙම වාහනයට සිදු වූ අලාභය ඊට වගකිය යුතු පාර්ශවය වන එම රථයේ රියදුරු මහතාගෙන් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | අනතුරක් වූ වහාම ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සම්බන්ධව රියදුරු මහතුන් හට නිරන්තරයෙන් උපදෙස් ලබා දිය යුතු අතර අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) බස්නාහිර පළාත තුල පිහිටි කර්මාන්තපුර 5 ක කර්මාන්තශාලා 07 ක් කිසිදු නිෂ්පාදන කටයුත්තක් සිදු නොකර වසා දැමීම හේතුවෙන් පර්චස් 1535.7 ක් වූ ඉඩම් ප්‍රමාණයක් උපයෝජනය නොවී පවතින අතර ඉහත කර්මාන්තපුර 05 ද ඇතුළුව කර්මාන්තපුර 07 ක කර්මාන්තශාලා 57 ක් තම නිෂ්පාදන කටයුතු අපේක්ෂිත මට්ටමට වඩා අඩු ධාරිතාවයකින් පවත්වා ගෙන ගොස් තිබුණි. | බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක කර්මාන්තවලින් නිෂ්පාදන කටයුතු දැනට සිදු නොකරන කර්මාන්තශාලා 07 ක් කර්මාන්තපුර 05 ක පවතින බවත් තවත් කර්මාන්ත බොහොමයක් රටේ පවතින ආර්ථික අර්බුදය මත ආනයන සීමා කිරීම් තුළ හා ලැබෙන ඇනවුම් අනුව නිෂ්පාදන කටයුතු චක්‍රීය ක්‍රමය යටතේ සිදු කරන බව . | නිෂ්පාදන කටයුතු සිදු නොකරන කර්මාන්තකරුවන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර දැනට පවතින කර්මාන්තපුරවල නිෂ්පාදන කටයුතු කරගෙන යාමේදී කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමුවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේදි නිකුත් කරනු ලබන ඉඩම් වෙන් කිරීමේ ලිපියට අනුව ඉඩම වෙන් කිරීමෙන් පසුව අවුරුදු 35 ක දීර්ඝකාලීනව බදු ගිවිසුමක් අත්සන් කල යුතු වුවද කර්මාන්තපුර 33කින් උලපනේ කර්මාන්තපුරය, නාලන්ද (මාතලේ) කර්මාන්තපුරය හා බස්නාහිර පළාත තුල පිහිටි කර්මාන්තපුර 08 ක් වශයෙන් කර්මාන්තපුර 10 කට අදාලව ලබාදුන් තොරතුරු අනුව කර්මාන්තකරුවන් 91 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | කර්මාන්තපුරවලින් ඉඩම් වෙන් කර දී ඇති, එහෙත් බදු ගිවිසුම් තවමත් සකස්වී නොමැති ආයෝජකයින්ට එම ඉඩම් කට්ටි සඳහා දීර්ඝ කාලීන බදු ඔප්පු ලබා දීම කඩිනම් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් කර්මාන්තපුර මට්ටමින් ජංගම සේවාවන් පැවැත්වීම 2021 වර්ෂයේදී ආරම්භ කර ඇත.ඒ අනුව 2022 හා 2023 වර්ෂයන්හිදි ජංගම සේවාවන් 07ක් පවත්වා ඇත. එහිදී ඒ ඒ ආයෝජකයන් විසින් බදු ඔප්පු සැකසීමේ ක්‍රියාවලියේ සිදු කල යුතු ඉදිරි ක්‍රියාමාර්ග හා ලබාදිය යුතු ලේඛන පිළිබඳව උපදෙස් ලබාදී ඇත. | කර්මාන්තකරුවන් සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඇ) | කර්මාන්තපුර 03 කට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු මුදල රු.79,155,035 ක් වුවද 2023 ජුලි 19 දින වන විටත් එම මුදල් අයකර ගෙන නොතිබුණි. තවද, කර්මාන්තපුර 19ක හිඟ බදු මුදල් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණු බැවින් එම කර්මාන්තපුර 19ට අදාලව හිඟ බදු පවතීද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2023 වර්ෂයේ කර්මාන්තපුර 14 කින් අයකර ගනු ලැබ ඇති බදු මුදල් පිළිබඳව හා ඒවායේ ගෙවීමට ඇති හිඟ බදු මුදල් පිළිබඳ විස්තර අනුව පෙර වර්ෂවලට අදාළ හිග බදු මුදලින් රු.39,078,953 ක් 2023 වර්ෂයේදී අයකර ගෙන ඇත. | බදු මුදල් නිසි පරිදි ප්‍රමාදයකින් තොරව අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මැදිහත් විය යුතුය. |
| (ඈ) | 2022 වර්ෂය සඳහා වු අයවැය යෝජනා අනුව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප ස්ථානගත කිරීම හා නව ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාර සංවර්ධනය වෙනුවෙන් ආයෝජන අවස්ථා ලබාදීමේ ජාතික ව්‍යාපෘතිය යටතේ කර්මාන්තපුර 10 ක් ස්ථාපිත කිරීමට යෝජනා කර 2022 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තු අනුව ඒ සඳහා රු. මිලියන 100 ක් වෙන් කර තිබුණි. යෝජිත වැඩසටහන තුළ වැල්ලවාය කර්මාන්තපුරයක් ඉදිකිරීමට ඇස්තමේන්තු කර | මෙම නව ව්‍යාපෘතිය යටතේ සැලසුම් කළ පරිදි කර්මාන්තපුර 10 ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. එහිදී පුත්තලම දිස්ත්‍රික්කයේ ඉරණවිල කර්මාන්තපුරය ස්ථාපනය සඳහා හඳුනා ගන්නා ලද ඇමරිකන් හඬ පිහිටි ඉඩම ඒ සඳහා නිදහස් කර ගැනීම සම්බන්ධයෙන් ඇති වූ ගැටළුකාරී තත්වය හේතුවෙන් ඒ වෙනුවට මොණරාගල දිස්තික්කයේ වැල්ලවාය කර්මාන්තපුරය ස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කෙරිනි. කර්මාන්තපුරයක් ස්ථාපනය | කර්මාන්තපුර ස්ථාපිත කිරීමේදී නිසි ක්‍රමවේදයකට අනුව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඉඩම් තෝරා ගැනීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබුණද වැල්ලවාය කර්මාන්තපුරයේ ඉඩම් කොටස් කිරීම හා වැට හා ගේට්ටු ඉදිකිරීම වෙනුවෙන් 2022 වර්ෂයේදී රු.8,288,173 ක වියදම් දරා තිබුණි. මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කර්මාන්තපුරයක් දැනටත් ස්ථාපිත කර ඇති බැවින් හා එම කර්මාන්තපුරයේ ඉඩම් වෙන් කර දුන් කර්මාන්තකරුවන් 17 න් වර්තමානය වන විට කර්මාන්තකරුවන් 5 ක් පමණක් සාර්ථකව නිෂ්පාදන කටයුතු සිදු කරන බැවින් වැල්ලවාය ප්‍රදේශයේ තවත් කර්මාන්තපුරයක් ඉදිකිරීම වෙනුවට බුත්තල දැනටමත් ඉදිකර පවතින කර්මාන්තපුරය සංවර්ධනය කර කර්මාන්තකරුවන් නගා සිටුවීමට කටයුතු කිරීම සුදුසු බව නිරීක්ෂණය කෙරේ. | කිරීමේදී එහි යටිතල පහසුකම් (වැට, ගේට්ටුව, මාර්ග, ජලය හා විදුලිබලය) ලබාදීමට ප්‍රථම ඉඩමේ වට මැනුම, එළිපෙහෙළි කිරීම, ඉඩම් කට්ටි කර අභ්‍යන්තර මාර්ග භූමියේ සටහන් කර ගැනීම ආදී මූලික කාර්යයන් සිදු කල යුතු වේ. කර්මාන්තපුර 10 සඳහා තෝරාගත් ඉඩම් 10හිම ඉහත මූලික කාර්යයන්, අදාල ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් 2022 වර්ෂයේදීම ආරම්භ කරන ලදී. බුත්තල කර්මාන්තපුරයේ කර්මාන්ත ආරම්භ කිරීමට පවතින හිස් ඉඩම් කොටස් ගණන ඉතාම සීමිත බැවින් මොණරාගල දිස්ත්‍රික්කය තුළ නව කර්මාන්තපුරයක් ස්ථාපනය කිරීමට පියවර ගන්නා ලදී. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 668 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 660 ක් විය. ඒ අනුව පුරප්පාඩු 77 ක්ද අතිරික්ත 69 ක්ද නිරීක්ෂණය විය. එනම් ජ්‍යෙෂ්ඨ, තෘතිය, ද්විතිය හා ප්‍රාථමික මට්ටම්වල පිළිවෙලින් 12, 02, 42 ක් හා 21 වශයෙන් පුරප්පාඩු පැවති අතර ද්විතිය මට්ටමේ අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් 44 ක් සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් 25 ක්ද අතිරික්තව සිටි. | අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයේ ඒකාබද්ධ සේවයේ ජ්‍යෙෂ්ඨ , තෘතිය හා ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පවතින පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි මගින් ඉල්ලීම් කර ඇත. සංවර්ධන නිලධාරී තනතුරු අතිරික්ත 69 සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත. | අමාත්‍යාංශයේ කාර්යභාරය අනුව අනුමත කාර්ය මණ්ඩලය වෙනස් කර ගැනීමට හා ඒ අනුව වන පුරප්පාඩු පිරවීමට හා අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |